# පුරාණ ශ්‍රී ලංකාවේ විහාරාරාම පරිපාලනය හා කළමනාකරණය

## (අභයගිරි සංස්කෘත ශිලාලේඛනය ඇසුරෙන් විමසුමක්)

ඇතාබැඳිවැවේ නාලක හිමි[1], කේ. එම්. සිරිලාල්[2]

### හැඳින්වීම

පරිපාලනය යනු ආයතනයක් හෝ යම්කිසි පිරිසක් නිවැරදිව සංවිධානය කරීම හා අධීක්ෂණය කිරීම සම්බන්ධව කටයුතු කරීමයි.ඒ අනුව මෙරට පැවති ආරාම පරිපාලන පිළිබඳව මෙයින් විමර්ශනයට ලක්කෙරේ. .ශ්‍රී ලංකාවේ පැරණි විහාරාරාම පරිපාලනය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී සාහිත්‍ය මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් ලැබෙන්නේ මහඟු පිටුවහලකි. ඒ අනුව පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අතරින් ශිලා ලේඛන මෙරට විහාරාරාම පරිපාලනය පිළිබඳව අධ්‍යයනය කිරීමට ඇති වැදගත් මූලාශ්‍රයකි. පුරාණ ශ්‍රී ලංකාවේ විහාරාරාම පිළිබඳව හා විහාරාරාම පරිපාලනය පිළිබඳව තොරතුරු විමර්ශනයේ දී විශාල සාධක ප්‍රමාණයක් සංස්කෘත ශිලා ලේඛන තුළින් අනාවරණය වේ. 1894 දී අනුරාධපුර අභයගිරිය විහාරය පරිශ්‍රයේ කුට්ටම් පොකුණට උතුරු දෙසින් පිහිටි නටඹුන් ගොඩනැගිලි ආශ්‍රිත කැණීම්වලදී සොයාගන්නා ලද අභයගිරිය සංස්කෘත ශිලා ලේඛනය තත්කාලීන භික්ෂු ආකල්ප, විහාරාරාම කාර්යයන් හා විහාරාරාම පරිපාලනය සම්බන්ධව වැදගත් තොරතුරු රැසක් පිළිබඳව කරුණු අධ්‍යයනය කළහැකි ශිලා ලේඛනයකි. ඊට අමතරව මිහින්තලය කළුදිය පොකුණ ලිපියද අභයගිරිය භික්ෂූන් පිළිබඳ ව ලියවුනු මෙවැනි ම ශිලා ලේකනයකි.මෙම අභයගිරි ශිලා ලේඛනය පිළිබඳ අදහස් දක්වන ඇම්. ද සිල්වා වික්‍රමසිංහ මෙම ශිලා ලේඛනය ක්‍රි:ව: 9 වන ශතවර්ෂයේ ප්‍රථම භාගයට අයත් කළ හැකි බව දක්වයි. මහාචාර්ය ඒ.වී සුරවීර පුරාණ ශ්‍රී ලංකාවේ විහාරාරාම පරිපාලනය හා සම්බන්ධකතිකාවත් අතරින් හමුවන පළමු වැන්න අභයගිරි ශිලා ලේඛනය බව දක්වයි. ඒ අනුව මෙරට පැවති විහාරාරාම පරිපාලනය සම්බන්ධව කරුණු අධ්‍යයනය කල හැකි වැදගත් මුලශ්‍රයක් වශයෙන් අභයගිරි සංස්කෘත ශිලා ලේඛනය හඳුනා ගත හැකිය.

### පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින ප්‍රධාන බෞද්ධ ආගමික ස්ථානවල ඇති වී තිබෙන පරිපාලන හා කළමණාකරන ගැටලු විසදා ගැනීම සඳහා අභයගිරි

---

[1] උපාධි අපේක්ෂක, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
Nalakahimi.19910401@gmail.com
[2] උපාධි අපේක්ෂක, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

සංස්කෘත ශිලාලේඛනය කෙතෙක් දුරට ඉවහල් කර ගත හැකිද යන්න විමසා බැලීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

උක්ත පර්යේෂණය සිදු කිරීමේ දී දත්ත රැස්කිරීම පූර්වයෙන්සාහිත්‍ය මූලාශය පරිශීලනය සිදු කරන ලදී. මීට අමතරව ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා ආදී පර්යේෂණ ක්‍රමවේද දත්ත රැස් කිරීමට භාවිත කරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

අභයගිරිය සංස්කෘත ශිලාලේඛනය විහාර පරිපාලනය හා සම්බන්ධ තොරතුරු හා තනතුරුවලට අදාළ වගකීම් පිළිබඳ සඳහන්වන ප්‍රමුඛතම ශිලාලේඛනයයි. මෙම ශිලා ලේඛනයට අනුව ප්‍රධාන විහාරාරාමයන් තුනක් වෙයි (ඤාණවිමල හිමි, 2001:11). එනම් ''හුණාල'' ''ලහසිකා'' ''මුණග්‍රාම'' වන අතර මෙම ප්‍රධාන විහාරවලට ගම් තුන බැගින් වෙන් කොට ඇත. ඒ අනුව ''හුණාල'' නම් විහාරයට හුණාල ග්‍රාම, අම්බල ග්‍රාම, උලවන්තරී ඛණ්ඩි ග්‍රාම යන ගම් තුනද ''ලහසිකා'' නම් විහාරයට ලහසිකා, උරුල්ගොනුම්, චීවර නව කම්ම ග්‍රාම යන ගම් තුන හා ''මුණග්‍රාම'' නම් විහාරයට කිරා, පල්ලව, මුණග්‍රාම යන ගම් බෙදා ඇත. මෙම ප්‍රධාන විහාරස්ථාන තුනෙහි උපසපන් භික්ෂූන් තුන් නමක් හා සාමණේර භික්ෂූන් වහන්සේලා දෙනම බැගින් නතර කළ යුතු බව මෙම ශිලා ලේඛනයෙහි සඳහන් වෙයි. එසේම අනෙක් විහාරවලද සමණේරයන් වහන්සේලා එක් අයකු බැගින් නතර කළ යුතු බව සඳහන් වීම විශේෂත්වයක්වන අතර එය ආරාම පාලනයේ දී ගන්නා ලද වැදගත් පියවරකි. එසේම මෙම ශිලාලේඛනයෙහි සඳහන්වන තවත් විශේෂ කරුණක් වන්නේ එක භික්ෂුවකට දෙදෙනෙකුට ප්‍රමාණවත්වන පරිදි ආහාර ලබාදිය යුතු බවත් එක භික්ෂුවකට සරිලන පරිදි සිවුරු දිය යුතු බවත්ය (චන්දවිමල හිමි, 2012:94). එසේම ලිපියේ සඳහන්වන ආහාර වේලෙහි වැඩි කොටස ගිහි සේවකයෙකු සඳහා වෙන් කර ඇත. විහාරස්ථානයේ වතාවත් කටයුතු කිරීමේ අදහසින් හා විහාර පරිපාලනය පහසු කර ගැනීමේ අදහසින් ගිහියෙකු නවත්වා ගැනීම හා ඒ සඳහාඔහු වෙනුවෙන් ආහාර වේලක් නියම කර ඇති බව සඳහන්ය.

අභයගිරි ශිලාලේඛනයෙහි ''පඤ්ජිකාස්ථවිරෛරෙව පලදායික නිරූපනෝය'' දැක්වෙන ආකාරයට විහාර පරිපාලනය පහසු කර ගැනීමට ඒ ඒ ගම්වලින් ලැබෙන ආදායම විහාරස්ථානයට ගෙන්වා ගණකයන් ''ගණක'' සංඝයා අනුමත කරණ ලද භික්ෂූන් ඉදිරියේ අය වැය හා ලාභය පෙන්වා ලේඛන ගත කළ

යුතු යැයි දැක්වේ (අමරවංශ හිමි 1970:11). මෙහි ඇති තවත් සුවිශේෂි ලක්ෂණයක්වන්නේ විහාරස්ථානයේ වාර්ෂික අය වැය ලේඛනය පිළිබඳ අවධානය යොමු කොට තිබීමයි. එසේම අය වැය ලේඛනය කෙසේ සකස් කරන්නේ ද යන්න දක්වා ඇත.ලහසිකා ගම හා උරුල්ගොනු ගමට සිවුරු පිළියෙල කිරීම හා විහාර නව කර්ම කිරීම පිණිස අය වැයක් ද, හුණාල ගම, උලවන්තරි හා කණ්ඩි යන ගම් වලට තවත් අය වැයක් ද කිරා සහ පල්ලව යන ගම්වලට තවත් අය වැයක්ද සුනග්‍රාම ගමට වෙනම අය වැයක්ද වශයෙන් වෙනම අය වැය සකස් කළ යුතු බව සඳහන් වේ(ඥාණවිමල හිමි 2001:10). එම කරුණින් සනාථ වන්නේ පිරිස් පාලනය පමණක් නොව මිල මුදල් පරිපාලනයද ක්‍රමවත්ව සිදු කොට ඇති බවය.

තවද මෙම ශිලා ලේඛනයට අනුව යමෙකුගේ වරදින් යම් දෙයකට හානියක් වුවේ නම් එහි අලාභය ඔහු විසින්ම විහාරයට ගෙවිය යුතු බවද භික්ෂුව අනිවාර්යෙන්ම එය බාර ගත යුතු බව ද සඳහන් වෙයි. යමෙකු එම අවස්තාවේදී භික්ෂුවගෙන් අනුකම්පාව ඉල්ලා සිටි කල පාඩුව භාරගත යුතු බවත් අනුකම්පා කිරීම භික්ෂුවගේ පුරුද්දක් බවත් එසේ අනුකම්පා කොට මෙවැනි අවස්ථාවක කටයුතු කළහොත් පසුකාලීනව විහාරස්ථානය විනාශවන බවත් සඳහන් කරයි. මෙවැනි තත්ත්වයන් වැළැක්වීම සඳහා භික්ෂූන්ට මෙසේ භාර ගැනීමට බළකර ඇති අතර අලාභය නොගෙවන සේවකයා අස් විය යුතු බවද මෙහි සඳහන් වේ.

විහාරාරාම පරිපාලනය හා සම්බනධ තවත් වැදගත් කාරණයක් මෙම ශිලා ලේඛනයේ දැක්වේ. ඒ අනුව විහාරයට අනුගතව සිටින්නාවූ පුද්ගලයන් හැර වෙනත් පුද්ගලයන් සම්බන්ධව කටයුතු කිරීමේදී කෙසේ කටයුතු කළ යුතු ද යන්න දක්වා ඇත. ඒ අනුව අපිරිසිදු ලෙස යම් අයෙකු විහාරයක සිටින්නේ නම් ඔහු වහාම ඉවත් කළ යුතු බව දක්වා ඇති අතර විහාරවල නොවිසිය යුත්තන් විසි එක් දෙනෙකු ද දක්වා ඇත (පුඤ්ඤසාර හිමි, 2000:28). එරෙමන්ම නියෝග දාහතරක් ද දක්වා ඇත. විහාරාරාම පරිපාලනයේ දී ඉතා ප්‍රකට ලෙස භාවිතයට ගැණෙන මෙම කරුණු දාහතර මඟින් පැහැදිලිවන්නේ ක්‍රමවත් පරිපාලන ව්‍යුහයක් අභයගිරිය විහාර සංකීර්ණයේ පැවති බවයි. විහාරාරාම පරිපාලනයේදී ඒ ඒ කාර්යන්ට නියමිත පුද්ගලයන් වැඩවලට යොමු කරගත යුතු වෙයි. මෙම ශිලා ලේඛනයෙහි එවැනි පුද්ගලයන් ''පංචකෞලිකයන් '' යනුවෙන් හඳුන්වා ඇත (කරුණාරත්න, 2000:3-4).

ඊට අමතරව විහාරයක වාසය කරන භික්ෂූන් පිළිබඳ මෙහි අන්තර්ගත වේ. ඉහත සඳහන් විහාරයන්හි සිව් මහානිකායන්ට අයත් භික්ෂූන් විසිපස්නම බැගින් හුණාලා සහ ලහසිකා යන විහාරවල සිටි බවත් ඒ අතර''චාතුර්මහානිකායේෂු පංචවිංශතඃ තපස්විනඃ තේ ශතන් නේවාසිකානං චත්වාරිංශත් ශාස්ත්‍රාභි යුක්තාස් තපස්විනඃ'' ශාස්ත්‍ර උගතුන් හතලිස් නමක් සිටිය යුතු බවත් සඳහන්ය.මෙම ලේඛනයට අනුව

විහාරාරාමවල පෞද්ගලික අධිකාරිත්වයක් දැකිය නොහැකි අතර සාංඝික ක්‍රමයට අනුව එහි කටයුතු සිදුවී තිබේ. ආරාමික භික්ෂූන් අතර ප්‍රධානත්වය දී ඇත්තේ ශාස්ත්‍ර උගතුන්ට හා විනයකාමී භික්ෂූන්ට ය. වෙනත් විහාරයක උපසම්පදාව ලබා පැමිණෙන භික්ෂූන් මුලින් සිටි විහාර හා තිබූ සබඳතා නැවැත්විය යුතු බව දක්වයි. සම්පත් පරිහරණයද ප්‍රවේශමෙන් සිදු කළ යුතු බවද සඳහන් වේ (චන්දවිමල හිමි, 2012:105).

මෙම ශිලාලේඛනයට අනුව පිළිගත් ගිහි පිරිසක් ද අනුරාධපුර යුගයේ අවසාන භාගයේ විහාරාරාම පරිපාලනය සඳහා සම්බන්ධ වී ඇති බව සඳහන් වේ. ඒ සඳහා කාරික, වාරික, පරිවාහන ආදි වශයෙන් නිලධාරීන් පත් කොට ඇත. සේවකයෙකු වරදක් කළහොත් ඔහු සතු ඉඩමක් හෝ වෙනත් හිමිකමක් ඉවත් කරන්නේ නම් ඔහුගේ දඬුවමෙන් පසුව එය නැවත ඔහුටම දිය යුතු බව දක්වා ඇත. මෙය අභයගිරි ශිලා ලේඛනයේ සඳහන් වන වැදගත් පරිපාලනමය ක්‍රමවේදයක් ලෙස දැක්විය හැකිය. නැවත ඔහු එම වරද කළහොත් මිස ඔහුගෙන් ඒවා ඉවත් කිරීම වලක්වා ඇත (චන්දවිමල හිමි 2012:106). එසේම වැඩක් භාරගත් අයෙකු එය දින හැටක් ඇතුළත කළයුතු අතර සෑම විටම භාර දිය යුත්තේ දින හැටකින් නිම කළ හැකි වැඩ පමණි. වැඩ කල් දැමීම අනුමත නොකර ඇති අතර එම කරුණ ද පරිපාලනමය වශයෙන් වැදගත් කරුණකි. තවද අභයගිරි සංස්කෘත ශිලාලේඛනයට අනුව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ගෙනගොස් ඇති අතර යමෙකු විහාරයෙන් නෙරපන්නේ නම් එය සංඝ සම්මුතියෙන් සිදු කර යුතුය යන්න සඳහන් කොට දැක්වීම මගින් පැහැදිලි වෙයි.

## සමාලෝචනය

වර්තමාන විහාර පරිපාලනය කෙසේ සකස්විය යුතු ද යන්න හා වර්තමාන විහාරාරාම පරිපාලනය සඳහා අභයගිරි සංස්කෘත ශිලාලේඛනය මඟින් අවබෝධ කොට ගත හැකි අතරඉහත සඳහන් සියලු කරුණු කෙරෙහි විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමේ දී ශ්‍රී ලංකාවේ පුරාණ විහාරාරාම පරිපාලනමය අවස්ථාවන් දක්වන වැදගත් ශිලා ලේඛනයක් ලෙස අභයගිරි සංස්කෘත ශිලාලේඛනයෙ ඇති කරුණුඅධ්‍යයනය මගින් මනා අවබෝධයක් ලබා ගත හැකි වෙයි. එසේම වර්තමානයේ මෙරට විහාරාරාමවල පවතින සියලු ගැටලු නිරාකරණය කර ගැනීම පිණිස මෙම ශිලා ලේකනයෙන් ලැබෙන්නේ මහගු උපකාරයකි.

ප්‍රමුඛ පද: විහාරාරාම පරිපාලනය, භෞතික හා මානව සම්පත් කළමණාකරනය,
අභයගිරිය සංස්කෘත ශිලා ලේඛනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

අමරවංශ හිමි, කොත්මලේ. (1969). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ 10: ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

ඥාණවිමල හිමි, බෙල්ලන. (2001). ජේතවනාරාම සංස්කෘත ලිපිය. *ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ශාස්ත්‍රීය සංග්‍රහය.* කොළඹ: ප්‍රාචීන භාෂෝපකාර සමාගම.

කුලතුංග, ටී. ජී. (2004). *අභයගිරි පර්යේෂණ.* කොළඹ 08: මධ්‍යම සංස්කෘතික අරමුදල, රජයේ මුද්‍රණාලය.

චන්දවිමල හිමි, කළුන්දෑවේ. (2012). *ශ්‍රී ලාංකේය සංස්කෘත අභිලේඛන හා සමකාලීන සමාජය.* මිරිගම: ආකර්ෂා ප්‍රින්ටර්ස්.

පුඤ්ඤසාර හිමි, ජුලම්පිටියේ. (2000). *අභයගිරිය සංස්කෘත ශිලා ලේඛනයෙන් හෙළිවන ආගමික ජීවිතය.*(සංස්කෘතික පුරාණය) 3වන වෙළුම,කොළඹ: සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යංශය.